# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2047/26 - 2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා - 2017.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 64641 දරන ශ්‍රී ලංකාවේ සමාගමක් වශයෙන් සංස්ථාගත කරනු ලැබූ සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, 2016 මාර්තු 28 වන දින අංක 1960/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාඋපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ජෛව පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම සුදුසුකම වන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව හෝ ජෛව පද්ධති තාක්ෂණ විෂය ධාරාවෙන් එකවර ''සාමාන්‍ය සාමාර්ථ'' තුනක් (03) ලබා සිටීම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය පිළිබඳ කෙටි යෙදුම* |
|---|---|
| ජෛව පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී. එස්. සී. ගෞරව (ජෛව පද්ධති) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

12 - 397/1

1A - PG 3791 — 507 (2017/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එල්.ඩී.බී. 21/1978 (X).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පී. වී. 17745 දරන කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2016 අගෝස්තු මස 09 වන දින අංක 1979/21 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**I වන උපලේඛනය**

***කොන්දේසි***

කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව ඇති සිල්ලර අලෙවිකරණ හා සන්නාමකරණය පිළිබඳ කළමනාකරණ (ගෞරව) උපාධිය සහ සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ කළමනාකරණ (ගෞරව) උපාධිය යන වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ ''3ක්'' එකවර ලබාගැනීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව විය යුතු ය.

**II වන උපලේඛනය**

| *I තීරය*<br>*උපාධි පාඨමාලාව* | *II තීරය*<br>*උපාධි පාඨමාලාව සඳහා කෙටි යෙදුම* |
|---|---|
| සිල්ලර අලෙවිකරණ හා සන්නාමකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බීඑම්ජීටීගෞරව (සිල්ලර අලෙවිකරණ හා සන්නාමකරණය) |
| සැපයුම්දාම කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බීඑම්ජීටීගෞරව (සැපයුම්දාම කළමනාකරණය) |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

12 - 397/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.